GMOA
TU No. 291
ESTABLISHED IN 1926
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

29.08.2011

**පුවත්පත් නිවේදනය**

ශ්‍රී ලංකාවේ වෛද්‍යවරු වෛද්‍ය ආඥා පනතේ 29 වගන්තිය යටතේ ලියාපදිංචිය ලබති. ඒ සඳහා වෛද්‍ය උපාධියක් ලබා තිබීම අනිවාර්යය සාධකයකි. කලකට ඉහත ඇපෝතිකරිවරුන් වශයෙන් 41 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වූ කණ්ඩායමක් විය. මෙම තනතුරු නාමය පසු කලෙකදී වෛද්‍ය සහකාර වශයෙන්ද, ඉන් අනතුරුව සහකාර වෛද්‍යවරුන් වශයෙන්ද වෙනස්කර ගන්නට යෙදුණි. උපාධියක් නොමැතිව ලොව කිසිදු රටක වෛද්‍යවරයෙකු වශයෙන් සේවය කළ නොහැක. උපාධියක් නොමැති මොවුහු රුසියාවට යාම පිණිස කලකට පෙර, වසර තුනක වැටුප් සහිත නිවාඩු ලබා ගන්නා ලදී.

මෙම ඇපෝතිකරවරුන් පිරිස අදාළ උපාධිය සඳහා රුසියාවට යාම පසෙක තබා, වැටුප් සහිත නිවාඩු ලබමින් පෞද්ගලික වෛද්‍ය සේවයේ නිරත වූහ. කෙසේ නමුත් අවසානයේ දුන් මුදලට හිලව් ලෙස "උපාධි සහතිකයක්" හිමිකරගෙන ඇති අතර එහි සඳහන්ව ඇත්තේ වසර තුනක නේවාසික පූර්ණ කාලීන පාඨමාලාවක් ඔවුන් හැදෑරූ බවයි. නමුත් මෙම ඇපෝතිකර පිරිසගේ ගමන් බල පත්‍ර පරීක්ෂා කිරීමේදී ඔවුන් මාස හයකට අඩු කලක් පමණක් රුසියාවේ ගතකර ඇති බව මොනවට පැහැදිලි විය. මෙයින් නතර නොවූ මොවුහු එම හොර සහතිකය ඉදිරිපත්කර වෛද්‍ය සභාවේ 29 වගන්තිය යටතේ උපාධිධාරී වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටියහ. 2006 වසර දී මෙය සලකා බැලූ ගරු ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමිය, විසින් මෙම ව්‍යාජ සහතිකයකට වෛද්‍ය ලියාපදිංචිය ලබා නොදියයුතු බව ඓතිහාසික නඩු තීන්දුවක් මගින් තහවුරු කරනු ලැබිණ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් සහ වෛද්‍ය සභාව මෙම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවට පිටුපා හොර සහතික ලැබූ ඇපෝතිකරිවරුන්ට වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබාදීම සඳහා අදාළ කටයුතු සකසමින් සිටිති. හොර සහතිකයට වෛද්‍ය ලියාපදිංචිය ලබාදුනහොත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පෙර දැනුම් දීමකින් තොරව ක්‍රියාමාර්ග සමස්ථ සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි අනාගතය සහ යහපැවැත්ම වෙනුවෙන් අවශ්‍ය සියලුම ගන්නා බව දැනුම්දෙමු.

මෙයට විශ්වාසී,

for [signature]

වෛද්‍ය හන්දික එපිටකඩුව,
ලේකම්.

වැඩිදුර විස්තර — වෛද්‍ය උපුල් ගුණසේකර - 0716841272
වෛද්‍ය සංකල්ප මාරසිංහ - 0714486770